**ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් - 2014**

**--------------------------------------------------------------**

ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් හා එහි පරිපාලිතයන්හි 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනතේ 16 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී ආයතන විසින් විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන (කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**(අ) තත්ත්වාගණනය කළ මතය - සමාගම**

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි (ANCL) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතනයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**(ආ) තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2.1 හා 2.2.2 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (ANCL) හා එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතනයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමාගමේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයන් වන සීමාසහිත ලේක් හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, සීමාසහිත ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගම සහ සීමාසහිත බිස්නස් ලංකා ඒ එන් (පුද්ගලික) සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දරන ලද විශාල පාඩු හේතුවෙන් සීමාසහිත ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගමේ වාණිජ මෙහෙයුම් 2012 වර්ෂය තුළ නවතා තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම පරිපාලිතයේ ශුද්ධ වත්කම් ඉතා අයහපත් ලෙස පිරිහී තිබුණි. කෙසේ වුවද සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය පදනම් කරගෙන සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර තිබුණු අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 57 වගන්තිය ප්‍රකාරව නුබුන්වත් බව පිළිබඳ අධ්‍යක්ෂ ප්‍රකාශනය එහි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) සීමාසහිත බිස්නස් ලංකා ඒ එන් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ දරන ලද විශාල පාඩු හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව ශුද්ධ වත්කම් සියයට 87 කින් අඩු වී තිබූ අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ 57 වගන්තිය ප්‍රකාරව

සමාගමේ නුබුන්වත්බව පිළිබඳ පරීක්ෂණ අවශ්‍යතාවය සතුටුදායක වී නොතිබුණි. කෙසේ වුවද සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය මත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමඟ සීමාසහිත බිස්නස් ලංකා ඒ එන් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර තිබුණි.

**2.2.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ ආයතනයන් (SME'S) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කෙරේ.

| | වගන්තියට යොමුව | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | 2.52 වගන්තිය | වෙළඳ ණයහිමියන්ගේ පැවති රු.256,560 ක හර ශේෂයක් වෙනම දක්වනු වෙනුවට සමාගම විසින් එකිනෙකට හිලව්කර තිබුණි. |
| (ආ) | 23.10 වගන්තිය | සමාගමේ වාර්ෂික ප්‍රකාශන අංශයෙන් හා වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ආදායම සමාගම විසින් හඳුනාගෙන වෙනම දක්වා නොතිබුණි. |
| (ඇ) | 8.5 වගන්තිය | බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය පිළිබඳ යොදාගත් ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |
| (ඈ) | 33.9 වගන්තිය | ලේක් හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමට පෙර අයත්ව තිබූ දේපල උකස් කිරීම ප්‍රමිතියේ අවශ්‍යතාවය පරිදි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |

**2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයන්ගේ ප්‍රමාද වී පැමිණීම හේතුවෙන් වැටුපෙන් අය කර ගැනීම් සහ වෙනත් දඩ මුදල් එකතුව රු.4,252,848 ක් දඩ අරමුදල් ගිණුමට බැර කර තිබූ අතර එම ගිණුමේ රු.7,829,382 ක සමුච්චිත බැර ශේෂය 2014 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් ලෙස දක්වා තිබුණි.

(ආ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සටහන්වල දක්වා ඇති පරිදි ආදායම හඳුනා ගැනීම පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාරව පුවත්පත් බෙදාහැරීමේදී ආපසු භාර ගැනීම සඳහා අනුමත කරන ලද පුවත්පත්වල වටිනාකම සඳහා සමාලෝචිත වර්ෂය ආරම්භයේ හා අවසානයේ ගැලපීම් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.564,315 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාගමේ වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ පොත් මුද්‍රණය කිරීම සඳහා රු.2,190,724 ක මුදලක් දරා තිබුණද, 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් නොවිකුණන ලද මුද්‍රිත පොත් තොග තහවුරු කර ගිණුම් ගතකර නොතිබුණි. කෙසේ වුවද රු.4,841,720 ක් වටිනා නොවිකුණන ලද පොත් තොග 2015 මැයි 07 දක්වා දෙපාර්තමේන්තුවේ ඉතිරිව පැවතුණි.

(ඈ) විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, වර්ෂ 1 කට වැඩි කාලයක් හිඟව පැවති ණයගැතියන්ට සමාන මුදලක් බොල් හා අඩමාන ණය ලෙස ප්‍රතිපාදනය කර තිබුණි. එසේ වුවද සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය රු.5,594,856 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පෙර වර්ෂ දෝෂ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමෙන් තොරව 2012 වර්ෂය තුළ ප්‍රචාරණ නියෝජිතයෙකු විසින් රැස්කරන ලද ප්‍රචාරණ ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුළ ඔහුට දිරි දීමනා ගෙවීම සඳහා රු.3,623,786 ක මුදලක් වෙන් කර තිබුණි.

(ඊ) 2014 දෙසැම්බර් 31 දිනට ණය නිරවුල් කිරීම පිළිබඳ හඳුනා නොගැනීම හේතුවෙන් එදිනට විවිධ ණයගැතියන්ගේ වටිනාකම රු.2,400,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව, ණයහිමි ලෙජරයේ ශේෂ හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී සංඛ්‍යා අතර එකතුව රු.128,253 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) ණයගැති ලෙජර ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී සංඛ්‍යා අතර රු.7,017,468 ක හර ශේෂයේ වෙනසක් හා රු.6,455,417 ක බැර ශේෂයේ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) වාණිජ මුද්‍රණ ආදායමට අදාළව වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ආදායම් ලේඛනය හා 2014 දෙසැම්බර් 31 දිනට ගිණුම්කරණ පද්ධතියෙන් ජනනය වන සංඛ්‍යා අතර රු.21,362,336 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඈ) සැසඳීම් කරන ලද තොග විෂයයන් 14 කට අදාළව ලෙජර ශේෂය හා භෞතිකව සත්‍යාපනය කරන ලද තොග ශේෂ අතර එකතුව රු.11,285,183 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

**2.2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාස 6 කට වැඩි කාලයක් පැවතුණු රු.206,489 ක් වූ ඉදිරිපත් නොකරන ලද චෙක්පත් සම්බන්ධයෙන් සමාගම අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) සමාගමේ බැංකු ගිණුම් 8 ක රු.2,222,975 ක් හා රු.2,436,958 ක් වූ පිළිවෙලින් උපලබ්ධි නොවූ හර ශේෂ සහ උපලබ්ධි නොවූ බැර ශේෂ 2014 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. තවද ඉහත ශේෂ අතුරින් රු.694,386 ක උපලබ්ධි නොවූ හර ශේෂයක් හා රු.2,229,121 ක උපලබ්ධි නොවූ බැර ශේෂයක් 2015 ජුනි 30 දිනටද පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ණයගැතියන්ගෙන් කැඳවන ලද සනාථ කිරීම්වලට අනුව, රු.610,844,559 ක් වටිනා මුළු ණයගැතියන්ගෙන් රු.28,958,545 ක් වූ ණයගැතියන් ඔවුන්ගේ සමස්ත ශේෂයන් සමඟ එකඟ වී තිබුණි. කෙසේ වුවද රු.7,665,103 ක් වටිනා ණයගැතියන් ඔවුන්ගේ ශේෂයන් සමඟ

එකඟ වී නොතිබුණි. රු.574,220,911 ක් වූ වෙනත් ණයගැතියන්ගෙන් සනාථ කිරීම් 2014 මැයි 31 වන විටත් ලැබී නොතිබුණි.

(ඈ) වටිනාකම රු.1,527,632 ක් වූ අගරු චෙක්පත් 32 ක් සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොතිබූ අතර ඉන් රු.888,313 ක් වටිනා චෙක්පත් 17 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිටව පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ එක්තරා ණයගැතියකුට අදාළව රු.253,665 ක් වූ චෙක්පත් සමාගම විසින් භාරගෙන තිබුණි. මෙම චෙක්පත් භාරගන්නා අවස්ථාවේදී අදාළ බැංකු ගිණුම වසා තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල අයකර ගැනීමෙන් තොරව ලැබිය යුතු මුදලක් ලෙස පැවතුණි.

(ඊ) විගණනයට ඉදිරිපත් කරන ලද කාලවිශ්ලේෂණය අනුව, වෙළඳ ණයගැතියන් යටතේ දැක්වෙන රු.82,335,592 ක මුදලක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණු අතර ඉන් රු.18,820,432 ක් හෙවත් සියයට 21 ක් අයකර ගත නොහැකි ලෙස සලකා නීති අංශයට යොමු කර තිබුණි.

### 2.2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු.308,238,708 ක් වූ ස්ථාවර වත්කම් හා අවසාන තොගවලට අදාළ සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5) (ඇ) වගන්තිය | අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114(1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය | සේවකයින්ට ගෙවන ලද ප්‍රසාද දීමනා සඳහා උපයන විට ගෙවීම් බදු (PAYE) ලෙස රු.5,457,339 ක මුදලක් සේවකයින්ට ගෙවන ලද ප්‍රසාද දීමනාවලින් අයකර ගැනීමෙන් තොරව සමාගම විසින් ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) | 9.2 (ආ) හා (ඇ) වගන්තිය | සංවිධාන සටහන හා සේවක සංඛ්‍යාව සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. |
| (ii) | 9.2 (අ) වගන්තිය | සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය සංයුක්ත සැලැස්මේ ඇතුළත් කළ යුතුය. එසේ වුවද 2013 සිට 2016 දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ 2006 ජූලි 31 දිනට සහ 2013 |

| | |
|---|---|
| | දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය පමණක් ඇතුළත් කර තිබුණි. |
| (iii) 9.3.1 වගන්තිය | එක් එක් තනතුර සඳහා බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමයක් සියලු රාජ්‍ය ව්‍යවසායන්හි තිබිය යුතු අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරයේ එකඟත්වය සහිතව එම යෝජනා ක්‍රම අධ්‍යක්ෂ මණ්ඩලය හා අදාළ අමාත්‍යාංශය විසින් අනුමත කළ යුතුය. කෙසේ වුවද එසේ අනුමත කරන ලද බඳවා ගැනීම් යෝජනා ක්‍රමයක් හා උසස්වීම් පරිපාටියක් සමාගම සතුව නොතිබුණි. එබැවින් විශේෂ වෘත්තීය සුදුසුකම් අවශ්‍ය වන තනතුරු හැර ඉහළ කළමනාකරණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේදී නිශ්චිත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සඳහා අවධානය යොමු කර නොතිබුණි. |
| (iv) 4.2.6 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා නියමිත දිනට අදාළ රේඛීය අමාත්‍යාංශයට යවා නොතිබුණි. අවසාන කාර්තුව සඳහා වාර්තාව 2015 මැයි 19 දින යවා තිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 මාර්ගෝපදේශය | කතරගම ඉදිකරන ලද රු.මිලියන 32 ක් වටිනා ගොඩනැගිල්ලක් වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයීම් කමිටුව පත්කිරීම සඳහා ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඉ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58 (2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.5 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා සමාගම විසින් රු.74,236,890 ක මුදලක් වැය කර තිබුණද, ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා හා රියදුරු දීමනා තීරණය කිරීමට සහ ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කුලී පදනම මත වාහන සැපයීම පිළිබඳව තීරණය කිරීමට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ගෙන නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්වල නිවැරදි කිරීම් ගැලපීම් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.17,878,723 ක සියළුම ජර්නල් සටහන් විධිමත් හා අදාළ ආධාරක ලියකියවිලි හා අනුමැතිය ලබා ගැනීමෙන් තොරව නිකුත් කර තිබුණි. තවද බොහෝ අවස්ථාවලදී එකම පුද්ගලයා විසින් ජර්නල් සටහන් පිළියෙල කර සනාථ කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් හෝ ඊළඟ මාසය තුළ නිරවුල් කිරීමේ පදනමකින් තොරව අවස්ථා කිහිපයකදී නිලධාරීන්ගේ ඉන්ධන සීමාව ඉක්මවා නිලධාරීන්ට ඉන්ධන නිකුත් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා එහි පරිපාලිතයන්ගේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.71,877,570 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.73,074,312 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.1,196,742 ක පිරිහීමක් දැක්වුණි. විශේෂයෙන් බාහිර කාර්යයන්වලින් වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ශුද්ධ ආදායම අඩුවීම හා පුවත්පත් හා වාර සඟරාවල විකුණුම් පිරිවැය වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මෙම මූල්‍ය ප්‍රතිඵලවල පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2014 | 2013 |
|---|---|---|
| | ප්‍රතිශතය | ප්‍රතිශතය |
| දළ ලාභ ආන්තිකය | 47.52 | 47.86 |
| ලාභාන්තිකය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 90.55 | 91.81 |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 37.57 | 36.74 |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 9.45 | 9.07 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 2.37 | 3.86 |
| ජංගම අනුපාතය | 1.66 | 1.59 |
| ක්ෂණික අනුපාතය | 1.10 | 1.13 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලාභාන්තිකය පිළිවෙලින් සියයට 0.34 කින් හා සියයට 1.26 කින් අඩු වී තිබුණි.

### 3.3 සමාගම විසින් පවරන ලද නඩු හා සමාගමට එරෙහිව පවරන ලද නඩු

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාගමට එරෙහිව පවරන ලද නඩු 65 ක් තීන්දු අපේක්ෂාවෙන් පවතින බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සමාගමේ ලේකම්වරයාගෙන් ලැබුණු තොරතුරු අනුව, සමාගමට එරෙහිව පවරන ලද නඩු 84 ක් තීන්දු අපේක්ෂාවෙන් පවතින අතර එම නඩු වලට අදාළව නොවිසඳී ඇති හිමිකම් ප්‍රමාණය රු.මිලියන 6,378 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂය තුළ අසම්භාව්‍ය බැරකම් ලෙස රු.මිලියන 10.6 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 5.9 කින් හෙවත් සියයට 555 කින් ප්‍රතිපාදනය වැඩි කර තිබුණි.

**3.4 කාරක ප්‍රාග්ධන කළමනාකාරණය**

කාර්යක්ෂම ණය අයකර ගැනීමේ පරිපාටියක් හා විධිමත් කාරක ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියක් නොවීම හේතුවෙන් ඉකුත් වර්ෂය තුළ කාරක ප්‍රාග්ධන ගැටලු අවම කිරීමේ අරමුණින් සමාගම විසින් රු.මිලියන 175 ක බැංකු අයිරාවක් වාණිජ බැංකුවකින් ලබා ගෙන තිබුණි. මීට අමතරව බැංකු අයිරා පොලී ලෙස රු.මිලියන 20.4 ක මුදලක් සහ ඇප තැබූ ණය නිරවුල් කිරීමේ අඛණ්ඩ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පළමු මාස 09 තුළ පොලී මත දඩ මුදලක් ලෙස රු.446,509 ක්ද සමාගම විසින් ගෙවා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් 6 ක්, වාර සඟරා 25 ක් හා වාර්ෂික ප්‍රකාශන 03 ක් ප්‍රසිද්ධ කර තිබූ අතර ඉකුත් වර්ෂය තුළ පුවත්පත් 6 ක්, වාර සඟරා 22 ක් හා වාර්ෂික ප්‍රකාශන 03 ක් ප්‍රසිද්ධ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත්, වාර සඟරා හා වාර්ෂික ප්‍රකාශනවලින් ශුද්ධ දායකය රු. මිලියන 26 කින් අඩු වී තිබුණි. සමාගම විසින් ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් හා වාර සඟරා 7 කින් වර්ෂ 3 කට වැඩි කාලයක් සමාගම විසින් අඛණ්ඩව සෘණ දායකයක් උපයාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් හා වාර සඟරා 31 කින් පුවත්පත් හා වාර සඟරා 16 ක් රු. මිලියන 43 ක සෘණ දායකයක් උපයා ගෙන තිබුණි.

(ආ) වර්ෂය තුළ ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් හා වාර සගරා 31 ක් අතුරින් සියලු පුවත්පත් සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයට හිතකර දායකයක් ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාගමේ පුවත්පත් හා වාර සඟරාවලින් සමස්ත ප්‍රචාරණ ආදායම රු. මිලියන 38 කින් හෙවත් සියයට 1.6 කින් වැඩි වී තිබුණි.

(ii) සමාගමේ සමස්ත පුවත්පත් විකුණුම් ආදායම ඉකුත් වර්ෂයේ රු.මිලියන 408.9 සිට සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 383.1 දක්වා සියයට 6.3 කින් අඩු වී තිබුණි.

(iii) සමාගමේ වාර සඟරා බෙදාහැරීම් මුළු ආදායම රු. මිලියන 281.8 සිට රු. මිලියන 270.7 දක්වා සමාලෝචිත වර්ෂය තුළ සියයට 4 කින් අඩු වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ සියලු පුවත්පත් හා වාර සඟරා පිළිබඳ සමස්ත මුද්‍රිත පිටපත් සංඛ්‍යාව මිලියන 36.8 සිට මිලියන 35.5 දක්වා සියයට 3.6 කින් අඩු වී තිබූ අතර මුද්‍රිත ද්‍රව්‍ය පිරිවැය රු. මිලියන 968.7 සිට රු.මිලියන 1,029.7 දක්වා සියයට 6.3 කින් වැඩි වී තිබුණි. තවද, මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අඩු වී තිබුණද පුවත්පත් හා වාර සඟරා 04 කට අදාළ මුද්‍රිත ද්‍රව්‍ය පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ එක් පරිපාලිතයක් වන සීමාසහිත බිස්නස් ලංකා ඒ එන් (පුද්ගලික ) සමාගම එහි මෙහෙයුම් කටයුතු ඉකුත් වර්ෂය තුළදී ආරම්භ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 5.5 ක පාඩුවක් දරා තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 15.7 ක හිඟ හිටි ණයගැති ශේෂයෙන් රු.මිලියන 5.7 ක මුදලක් වර්ෂයකට වැඩි කාලයක් හිඟව පැවති අතර සමාලෝචිත වර්ෂය තුළ අඩමාන ණය ලෙස සලකා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ආදායම සියයට 6 කින් වැඩි වී තිබුණද ණය අයකර ගැනීමේ ප්‍රතිපත්තියක් නොතිබීම හේතුවෙන් හිඟ හිටි ණයගැති ශේෂ සියයට 58 කින් වැඩි වී තිබුණි.

(ආ) වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත එහි ප්‍රකාශන පොත් සාප්පු වලට නිකුත් කර තිබුණි. කෙසේ වුවද අදාළ පොත් සාප්පු වලින් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට සමාගම විසින් කිසිදු පියවරක් ගෙන නොතිබූ අතර වර්ෂ 5 සිට 10 කට වැඩි කාලයක් මේ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂ කිහිපය තුළදී පැවති විකුණුම් ආපසු එවීම් අඩුකර ගැනීමේ අරමුණින් එක් එක් පුවත්පතට වරින්වර ආපසු එවීමේ රේට පද්ධති (Return Rates System) සමාගම විසින් හඳුන්වා දී තිබුණි. එම පද්ධතියට නව සංශෝධන 2014 අගෝස්තු 01 දින සිදුකර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ සමස්ත විකුණුම් ආපසු එවුම් රු. 13,910,806 කින් වැඩි වී තිබුණු අතර මෙය සමාලෝචිත වර්ෂය සඳහා මුළු බෙදාහැරීම් ආදායමෙන් සියයට 18 කට සමාන විය.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂයන්ගෙන් රු.127,072,845 ක මුදලක් ප්‍රචාරණ නියෝජිතයන් මගින් ලැබුණු ප්‍රචාරණ දැන්වීම් වෙනුවෙන් රජයේ ආයතන 299 කින් ලැබිය යුතු විය. මෙය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.73,627,070 කින් හෙවත් සියයට 137 ක වැඩිවීමක් විය.
ඉහත හිඟ ශේෂයන්ගෙන් රු.9,069,409 ක මුදලක් වර්ෂ 01 කට වැඩි කාලයක් හිඟහිට පැවති බැවින් හිඟ ශේෂ අයකර ගැනීම සැක සහිත වේ. කෙසේ වුවද සමාගම රජය සතු ව්‍යාපාර ආයතනයක් ලෙස රජයේ දැන්වීම් සෘජුවම සමාගමට ලබා ගැනීම ආකර්ශනය කරගැනීම සඳහා විධිමත් පරිපාටියක් අනුගමනය කිරීමට සමාගම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඉ) විධිමත් අයකරගැනීම් ප්‍රතිපත්තියක් නොවීම හේතුවෙන් අඩමාන ණය සැලකිය යුතු ලෙස වැඩි වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය රු. මිලියන 22.5 කින් හෙවත් සියයට 34 කින් වැඩි වී තිබුණි.

(ඊ) සමාගම කොළඹ - යාපනය බස් සේවාවෙන් විශාල පාඩු දරා තිබුණි. පසුගිය වර්ෂ 4 ක කාල පරිච්ඡේදය තුළ රු.25,921,679 ක සමුච්චිත පාඩුවක් දරා තිබුණි.

(උ) මුද්‍රණ කාර්යයන් සඳහා යොදාගැනීමට පෙර කඩදාසි රීල් කැපීම සඳහා සාමාන්‍ය කාර්යයක් ලෙස බාහිර සමාගමකට යවා තිබුණි. 2014 ජනවාරි 01 සිට අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා සම්පූර්ණ වාර්තා නොමැතිවීම හේතුවෙන් යැවූ භාණ්ඩ හා ආපසු ලැබුණු භාණ්ඩවල බර ප්‍රමාණයේ වෙනස්කම් හේතුවෙන් රු.3,829,858 ක ඇස්තමේන්තුගත පාඩුවක් දරා තිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

කර්මාන්ත සම්මතයන්ට අනුව දළ මෙහෙයුම්වල පිළිගතහැකි අපතය සියයට 5 ක් විය. කෙසේ වුවද ඉකුත් වර්ෂ තුනක කාලපරිච්ඡේදය තුළ පුවත්පත් හා වාර සඟරා කිහිපයක් සම්බන්ධයෙන් පිළිගත හැකි සම්මතය ඉක්මවා තිබුණු අතර ඒ අනුව රු.19,017,522 ක අතිරේක පිරිවැයක් ඒ සඳහා දරා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ අපතය ඉක්මවීම වෙනුවෙන් සමාගමට රු.5,580,954 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

ප්‍රචාරණ දැන්වීම් නියෝජිතයින් සඳහා ඔවුන්ගේ ප්‍රචාරණ දැන්වීම් රැස්කිරීම් පදනම් කරගෙන ගෙවන සියයට 2.5 සිට සියයට 50 දක්වා වූ කොමිස් මුදල්වලට අමතර වශයෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ පිළිවෙලින් රු.11,799,436 ක් හා රු.12,491,960 ක දිරිදීමනා ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සඳහා දිරිදීමනා ලෙස ප්‍රචාරණ දැන්වීම් නියෝජිතවරයකුට රු.මිලියන 2.8 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි. කෙසේ වුවද ලෙජර් ගිණුමේ දිරිදීමනාවක් ලෙස රු.3,387,971 ක මුදලක් හෝ රු.587,971 ක අතිරේක මුදලක් බැර කර තිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, දැන්වීම් නියෝජිතවරුන් සඳහා සමාලෝචිත වර්ෂයේ දිරි දීමනා ලෙස රු.8,176,736 ක මුදලක් ලබා දීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්ගේ අනුමැතිය සහිතව එක් විශේෂිත දැන්වීම් නියෝජිතවරයකුට දිරි දීමනා ලෙස රු. 3,623,786 ක අතිරේක මුදලක් සපයා තිබුණි. කෙසේ වුවද 2012 වර්ෂය සඳහා දිරි දීමනා ගෙවීම් ලබාගැනීමට හිමිකම් ඇති වෙනත් නියෝජිතවරුන්ද සිටි හෙයින් එම ගෙවීමේ පදනම විගණනයේදී ප්‍රශ්නගත විය.

(ඇ) වාර්ෂික දිරිදීමනා ගෙවීම් සම්බන්ධයෙන් දැන්වීම් නියෝජිතායතන සමඟ එළඹි ගිවිසුම ප්‍රකාරව. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වර්තමාන රේට් කාඩ්පත මත සියලු ප්‍රකාශන ආවරණය කරමින් සියයට 10 ක් ලබා දීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද ඔවුන්ගේ දැන්වීම් එකතුව පදනම් කරගෙන සියයට 10 සිට සියයට 33 දක්වා වූ වට්ටම් ලබා දී තිබුණි.

**4.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

සීමාසහිත ලේක් හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමට පවරා ගන්නා ලද හෝකන්දර පිහිටි අක්කර 8 ක ඉඩම අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව 1985 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාපතිවරයා සහ "දිනමුතු" සඟරාවේ ප්‍රධාන සංස්කාරක විසින් දෙන ලද උපදෙස්වලට අනුව, අධ්‍යාපන ප්‍රකාශන 7 ක පිටපත් 21,000 ක් ඉකුත් වර්ෂය තුළ මුද්‍රණය කර තිබුණි. කෙසේ වුවද මුද්‍රිත පිටපත් සඳහා අධි ඇස්තමේන්තු කිරීම හේතුවෙන් රු.889,350 ක් වටිනා පිටපත් 13,475 ක් 2015 මැයි 31 දිනට ගබඩාවේ පැවතුණි. තවද පොත් සාප්පුවලට නිකුත් කරන ලද පිටපත් 6,500 කින් රු.258,588 ක් වටිනා පිටපත් 3,918 ක් ආපසු එවා තිබූ අතර ඒවා භෞතිකව පරීක්ෂා කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී ලංකා පුවත්හි රු.මිලියන 1.2 ක මුදලක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා කිසිදු ප්‍රතිලාභයක් 2015 මැයි 30 දක්වා සමාගමට ලැබී නොතිබුණි.

**4.7 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයක් වන සීමාසහිත ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගම විශාල පාඩු දැරීම හේතුවෙන් 2012 වර්ෂය තුළදී එහි මෙහෙයුම් නවතා තිබූ අතර ණය හිමියන්ට ගෙවිය යුතු රු.604,100 ක හිඟ ශේෂයන් සමාලෝචිත වර්ෂය තුළ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් නිරවුල් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 6.9 ක් වූ ආයෝජිත ප්‍රාග්ධනය හා සපයන ලද අතිරේක අරමුදල් සමාගමට අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ණය පදනම මත රු.30,596,049 ක් වටිනා මුද්‍රණ ද්‍රව්‍ය සමාගමට එම ද්‍රව්‍ය සපයන ලද සැපයුම්කරුවකුට නැවත සපයා තිබුණි. කෙසේ වුවද ඉහත ද්‍රව්‍ය සැපයීම සම්බන්ධයෙන් පොලියක් හා දඩ මුදල් ලෙස රු.735,807 ක් සමාගමට දැරීමට සිදු වී තිබුණි.

(ඇ) සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 5.9 ක් වටිනා වාහන 6 ක් වෙන්දේසියක් මගින් අපහරණය කර තිබුණි. මෙම වාහන 6 අතුරින් 4 ක් අපහරණය කිරීම සඳහා 2012 වර්ෂය තුළදී පියවර ගෙන තිබුණද එය එසේ කිරීමට අපොහොසත් වී තිබුණි. එබැවින් 2012 වර්ෂය තුළදී එම වාහන 04 අපහරණය කිරීමට නොහැකි වීම හේතුවෙන් රු. මිලියන 2.5 ක මුදලක් සමාගමට අහිමි වී තිබුණි.

(ඈ) රු.241,974 ක් වටිනා තීන්ත තොගයක් කල් ඉකුත් වී තිබූ අතර එය උපයෝජනය කළ හැකි තත්ත්වයේ නොතිබුණි.

(ඉ) දැන්වීම් නියෝජිතවරුන් මගින් එකතු කර ගන්නා ලද රජයේ දැන්වීම් වෙනුවෙන් සේවා දායකට හා දැන්වීම් නියෝජිතවරුන්ට වෙනස් රේටයන් දෙකකට ඉන්වොයිසි දෙකක් නිකුත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රජයේ දැන්වීම් සෘජුවම ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර නොගැනීම හෝ 2008 දෙසැම්බර් 24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ මාර්ගෝපදේශවලට අනුකූල වීමට නොහැකිවීම හේතුවෙන් දැන්වීම් ආදායමෙන් දළ වශයෙන් සියයට 30 ක ප්‍රමාණයක් සමාගමට අහිමි වී තිබුණි.

## 4.8 කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ අඩුපාඩු

කතරගම වන්දනා සංචාරක නිවාසයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) එකඟ වූ කාල පරිච්ඡේදය ඇතුළත ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර නොතිබුණි.

(ii) පත් කරන ලද උපදේශක ආයතනයක් විසින් පිළියෙල කරන ලද වංචනික ඇස්තමේන්තු පදනම් කරගෙන සමාගම විසින් ගෙවීම් කර තිබූ අතර ඒ අනුව දළ වශයෙන් රු. මිලියන 7 ක පාඩුවක් දැරීමට සමාගමට සිදු වී තිබුණි.

(iii) විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂණයට අනුව ලී වැඩ හා කොන්ක්‍රීට් වැඩවලට අදාළ අවශ්‍ය පිරිවිතරයන්ට අනුකූලවීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණු බව අනාවරණය විය.

(iv) කොන්ත්‍රාත් වැඩවලදී අපේක්ෂිත ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීමේ අරමුණින් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුළදී උපදේශක සමාගම විසින් කොන්ත්‍රාත් වැඩ නියාමනය කිරීම ක්‍රියාත්මක කර නොතිබූ බවද නිරීක්ෂණය විය.

## 4.9 වෙනත් ආයතනවලට මුදාහරින ලද මානව හා භෞතික සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ සහකාර කළමනාකරුවන් දෙදෙනෙකු හා ජ්‍යෙෂ්ඨ සහකාර මුදල් අයකැමිවරයකු ඇතුළත් නිලධාරීන් 10 දෙනෙකු බාහිර ආයතනයකට මුදා හැර තිබුණි. ඔවුන් වෙනුවෙන් වැටුප් , වේතන හා දීමනා ලෙස රු.6,377,850 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව, සමාගම විසින් කුලියට ගන්නා ලද වාහන තුනක් වෙනත් රජයේ ආයතනවලට මුදා හැර තිබුණු අතර මෙම වාහන සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ කුලී සහ ඉන්ධන ලෙස පිළිවෙලින් රු.1,740,000 ක් හා රු.1,488,240 ක් වැය කර තිබුණි.

## 4.10 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 228 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර එම බඳවා ගැනීම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) සේවකයින් බඳවා ගැනීම්, උසස් කිරීම් හා තනතුරෙන් පහළට දැමීම සඳහා විධිමත් පරිපාටියක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) අනුමත වැටුප් පරිමාණයන් අනුගමනය කිරීමෙන් තොරව සේවකයන්ට වැටුප් ගෙවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. සභාපති හා අංශ ප්‍රධානී විසින් සිදුකරන ලද සේවක ඇගයීම මත ඇතැම් අවස්ථාවලදී වැටුප් වර්ධක ලබා දී තිබුණි.

(ඈ) විගණනය විසින් සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව ඉහළ කළමනාකරණ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ඇගයීම් කිරීමෙන් තොරව එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) මූල්‍ය අක්‍රමිකතා හා වංචාවල යෙදුණු සේවකයින් හේතුවෙන් සමාගම විසින් දරන ලද මූල්‍ය පාඩු අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 පරිච්ඡේදය ප්‍රකාරව සමාගම විසින් 2013 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. කෙසේ වුවද ලබාගත හැකි වර්තමාන සම්පත්, සංවිධාන ව්‍යුහය හා ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල ආදී වැදගත් කරුණු එහි ඇතුළත් කර නොතිබූ අතර,ආයතනික අරමුණු ඉටුකර ගැනීම , විශේෂයෙන් නව මාධ්‍යය සම්ප්‍රදායට ඇතුළත් වීමට උපාය මාර්ග සකස් කිරීම , මෙහෙයුම් හා අලෙවි සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු කිරීම සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණය විසින් ඇගයීම් කර නොතිබුණි.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූලව පිළියෙල කර තිබුණි. කෙසේ වුවද සියලු පුවත්පත් බෙදා හැරීම වැඩි දියුණු කිරීම, තොරතුරු තාක්ෂණ දත්ත පදනම හා ජාලය පුළුල් කිරීම හා නවීකරණය කිරීම සහ ඒකරාශී වන මාධ්‍ය පිළිබඳ වඩා උද්දීප්ත ප්‍රකාශක බවට පත්කිරීම ආදීය

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් ඉලක්ක කරන ලද පරිදි ඉටුකරගෙන නොතිබුණි.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.2 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර එවැනි ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිව ප්‍රාග්ධන විෂයයන් ප්‍රසම්පාදනය සඳහා සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 68.8 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණි.

**5.4 අයවැය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 වගන්තිය අනුව, අයවැය ලේඛනය පිළියෙල කිරීම සඳහා කාල ඉලක්කය සහ එය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අනුගමනය කර නොතිබුණි.

(ආ) අයවැය පිළිබඳ ඵලදායී පාලනයක් සිදු කිරීම සඳහා සමාගමේ වියදම් වර්ගයන්ට අනුකූලව විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. එසේම අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන්ද නිරීක්ෂණය විය.

**5.5 නොවිසඳුණු විගණන විමසුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ නිකුත් කරන ලද විගණන වාර්තාවෙන් අවධාරණය කරන ලද පහත සඳහන් කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(i) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කුලී පදනම මත වාහන අත්කර ගැනීම
(ii) ටෙන්ඩර් කැඳවීමෙන් තොරව හා ගිවිසුම්වලට එළඹීමෙන් තොරව වාහන අත්කර ගැනීම
(iii) සීමාසහිත ලේක් හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් සමාගමේ හා සීමාසහිත ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගමේ ආයෝජනය කරන ලද පිළිවෙලින් රු.7,500,000 කින් රු.2,500,000 කින් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබීම .
(iv) වාර්ෂික ප්‍රකාශනවල ආදායම හඳුනාගැනීම

(ආ) 2013 දෙසැම්බර් 09 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කමිටුව විසින් කරන ලද පහත සඳහන් නියෝග පිළිපැද නොතිබුණි.

(i) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම විගණකාධිපතිට ඉදිරිපත් කිරීම
(ii) ලංකා පුවත්හි ආයෝජනය කරන ලද රු.මිලියන 1.2 ක් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු සිදු කිරීම

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ප්‍රසම්පාදන
(ආ) වාහන උපයෝජනය
(ඇ) ණයගැති කළමනාකරණය
(ඈ) ඉන්වෙන්ට්‍රි පාලනය
(ඉ) බලතල බෙදා හැරීම
(ඊ) වාණිජ මුද්‍රිත කාර්යයන්
(උ) ස්ථාවර වත්කම් පිළිබඳ පාලනය
(ඌ) කාරක ප්‍රාග්ධන කළමනාකරණය
(එ) බෙදා හැරීම - ආපසු එවීම
(ඒ) මානව සම්පත් කළමනාකරණය
(ඔ) වැටුප් ගෙවීම් පද්ධතිය